සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

(01) ශ්‍රී ලාංකිකයින් විසින් ආහාරයට ගනු ලබන ධාන්‍ය වර්ග දෙකක් වනුයේ,

(1) කඩල සහ මුං ඇට ය. (2) කව්පි සහ පරිප්පු ය.
(3) සහල් සහ කුරක්කන් ය. (4) බඩ ඉරිඟු සහ පරිප්පු ය.

(02) පහත සඳහන් ආහාර වර්ග අතරින් වැඩි ම ප්‍රෝටීන් ප්‍රතිශතයක් අඩංගු ආහාර වර්ගය වනුයේ,

(1) සෝයා බෝංචි ය. (2) මුං ඇට ය.
(3) කඩල ය. (4) උඳු ය.

(03) කාබෝහයිඩ්‍රේට හා මේදවල අන්තර්ගත මූලද්‍රව්‍යවලට අමතරව ප්‍රෝටීන්වල අඩංගු මූලද්‍රව්‍යය වනුයේ,

(1) කැල්සියම් ය. (2) පොටෑසියම් ය. (3) නයිට්‍රජන් ය. (4) යකඩ ය.

(04) සත්ත්ව ආහාර වර්ග අතරින් අසම්පූර්ණ ප්‍රෝටීන් අඩංගු ආහාරය වනුයේ,

(1) කරවල ය. (2) ජෙලටින් ය.
(3) බිත්තර ය. (4) හාල්මැස්සන් ය.

(05) කිසියම් සංඝටකයකින්, මිනිස් සිරුරේ සිදුවන කාර්යයන් පිළිබඳව සිසුවකු විසින් ලියන ලද සටහනක පහත සඳහන් කරුණු ඇතුළත්ව තිබුණි.

A - සෛලවල ස්ථායිතාව පවත්වා ගැනීම

B - රුධිරයේ සාන්ද්‍රණය පවත්වාගෙන යාම

C - ආහාර ජීර්ණයට, අවශෝෂණයට, පරිවහනයට උපකාරී වීම

D සිරුරේ උෂ්ණත්වය පාලනය කිරීම

ඉහත ප්‍රකාශවලට අදාළ සංඝටකය වනුයේ,

(1) තන්තු ය. (2) සෙලියුලෝස් ය.
(3) පෙක්ටීන් ය. (4) ජලය ය.

EXAMRESULTS.LK

(06) විටමින් E හඳුන්වන රසායනික නාමය වනුයේ,
(1) කැල්සිෆෙරෝල් ය.
(2) ටොකොෆෙරෝල් ය.
(3) සයනොකොබැලමින් ය.
(4) නැප්තාක්විනෝන් ය.

(07) විටමින් C බහුල පලතුරු වර්ග දෙකකි,
(1) නෙල්ලි සහ පේර.
(2) අලිගැටපේර සහ කෙසෙල්.
(3) කෙසෙල් සහ අන්නාසි.
(4) දොඩම් සහ අලිගැටපේර.

(08) පහත දැක්වෙනුයේ විටමින් වර්ගවලට අදාළ කරුණු කිහිපයකි.
A - මේදයේ ද්‍රාව්‍ය වේ.
B - බටර්, මාළු, මෝරතෙල් ආදී ආහාරවල අඩංගු වේ.
C - අස්ථි වර්ධනය සඳහා උපකාරී වේ.
D - ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි.
E - තුවාලයක් සිදු වූ විට රුධිරය කැටි ගැසීම ප්‍රමාද කරයි.
මේ අතරින් විටමින් A සම්බන්ධ කරුණු වනුයේ,
(1) A, B හා D ය.
(2) B, C හා A ය.
(3) A, D හා E ය.
(4) C, D හා E ය.

(09) මිනිසා වයස්ගත වීමත් සමඟ ම කැල්සියම් ඌනතාව නිසා ඇතිවන තත්ත්වය හැඳින්වෙනුයේ,
(1) ඔස්ටියෝමැලේෂියා ලෙස ය.
(2) රිකට්ස් ලෙස ය.
(3) ඔස්ටියෝපොරෝසිස් ලෙස ය.
(4) ක්‍රෙටිනතාව ලෙස ය.

(10) වැඩි සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයක සිට අඩු සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයකට ද්‍රව්‍ය අංශු ගමන් කිරීම හැඳින්වෙන්නේ,
(1) විජලනය වශයෙනි.
(2) බාහිර ආසෘතිය වශයෙනි.
(3) පදම් කිරීම වශයෙනි.
(4) විසරණය වශයෙනි.

(11) ජෑම්, සෝස් හා කරවල නිෂ්පාදනයේ දී භාවිත වන පරිරක්ෂක කාරක පිළිවෙළින්,
(1) සීනි, ලුණු සහ විනාකිරි ය.
(2) සීනි, විනාකිරි සහ ලුණු ය.
(3) ලුණු, විනාකිරි සහ සීනි ය.
(4) ලුණු, සීනි හා විනාකිරි ය.

(12) කැපූ පෘෂ්ඨය වාතයට නිරාවරණය වූ විට එන්සයිමීය දුඹුරු පැහැ ගැන්වීම සිදුවන ආහාරයකි,
(1) වම්බටු
(2) අන්නාසි
(3) මාළු
(4) වට්ටක්කා

(13) තිරිඟුවල අඩංගු ග්ලූටන් නම් ප්‍රෝටීනය මගින් සිදුවන කාර්යයකි,
(1) පිටි මෝලියෙහි ඇදෙන සුළු බවක් ඇතිවීම.
(2) පිටි මෝලියෙහි ඝන ස්වභාවය වැඩිවීම.
(3) පිටි මෝලියෙහි ව්‍යාප්ත ස්වභාවයක් ඇතිවීම.
(4) පිටි මෝලියෙහි තෙතමනය රඳා පැවතීම.

(14) රොටි, තෝසෙ හා පෑන්කේක් වැනි ආහාර පිස ගැනීමේ දී සිදුවන තාප සංක්‍රමණ ක්‍රමය වනුයේ,
(1) සන්නයනය යි.
(2) සංවහනය යි.
(3) විකිරණය යි.
(4) සංවහනය සහ විකිරණය යි.

(15) වක් වාෂ්පයෙන් සහ උඩු වාෂ්පයෙන් පිළියෙල කරගත හැකි ආහාරයකි,

(1) ලැවරියා (2) හැලප (3) වටලප්පන් (4) ඉඳිආප්ප

(16) ආහාර වේලකට දෛනිකව ඇතුළත් කළ යුතු ආහාර ප්‍රමාණ දැක්වෙන සටහන හැඳින්වෙන්නේ,

(1) පෝෂණ වගුව ලෙස ය.

(2) නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහන ලෙස ය.

(3) ආහාර පිරමීඩය ලෙස ය.

(4) පෝෂණ සංයුති සටහන ලෙස ය.

(17) ප්‍රධාන මේස ඇතිරිල්ල අපවිත්‍රවීම වැළැක්වීම සහ එහි අලංකාරය සඳහා උපකාර වනුයේ,

(1) අත් පිස්නාව ය. (2) මේස රෙද්ද ය.

(3) පොලිතීන් ඇතිරිල්ල ය. (4) අනු ඇතිරිල්ල ය.

(18) ගර්භාෂයේ වැඩෙන භ්‍රෑණයේ ස්නායු පද්ධතියේ වර්ධනය සඳහා බලපාන පෝෂකයකි,

(1) ෆෝලික් අම්ලය. (2) ඇස්කෝබික් අම්ලය.

(3) නිකොටිනික් අම්ලය. (4) පැන්ටොතනික් අම්ලය.

(19) ටෙස්ටොස්ටෙරෝන් යනු,


(1) පුරුෂ ප්‍රජනක හෝර්මෝනයකි.

(2) ස්ත්‍රී ප්‍රජනක හෝර්මෝනයකි.

(3) අග්න්‍යාශයික හෝර්මෝනයකි.

(4) තයිරොයිඩ් ග්‍රන්ථියෙන් නිපදවන හෝර්මෝනයකි.

◆ 20, 21 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූපය උපකාරී කරගන්න.




(20) ඉහත දැක්වෙන රූප සටහනේ A, B, C, D ලෙස නම් කර ඇති කොටස් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ගර්භාෂය, පැලෝපීය නාල, යෝනි මාර්ගය, ඩිම්බ කෝෂ

(2) පැලෝපීය නාල, යෝනි මාර්ගය, ඩිම්බ කෝෂ, ගර්භාෂය

(3) පැලෝපීය නාල, ගර්භාෂය, ඩිම්බ කෝෂ, යෝනි මාර්ගය

(4) ගර්භාෂය, ඩිම්බ කෝෂ, පැලෝපීය නාල, යෝනි මාර්ගය

(21) එම රූප සටහනේ දක්වා ඇති A කොටසින් සිදුවන කාර්යය වනුයේ,

(1) පරිණත ඩිම්බ මුදා හැරීම ය.

(2) කලලය අධිරෝපනය ය.

(3) ඩිම්බ පරිවහනය කිරීම ය.

(4) ස්ත්‍රී ප්‍රජනක හෝමෝන නිෂ්පාදනය ය.

(22) ස්ත්‍රියක් ගර්භණීභාවයට පත්වීම සඳහා ඉතා සුදුසු වයස් සීමාව වනුයේ,

(1) අවු. 14 -16 අතර ය. (2) අවු. 35 - 40 අතර ය.

(3) අවු. 20 - 30 අතර ය. (4) අවු. 30 - 45 අතර ය.

(23) සාමාන්‍ය කාන්තාවකට වඩා, දෙවැනි හා තෙවැනි ත්‍රෛමාසිකයේ පසුවන ගර්භණී කාන්තාවක් සඳහා වැඩිපුර අවශ්‍ය ප්‍රෝටීන ප්‍රමාණය පිළිවෙළින් වනුයේ,

(1) 3 g හා 7 g ය. (2) 5 g හා 9 g ය.

(3) 6 g හා 10 g ය. (4) 7 g හා 13 g ය.

(24) පූර්ව ප්‍රසව අවධිය තුළ, කලල අවධිය ලෙස හැඳින්වෙන්නේ,

(1) සංසේචනයේ සිට 2 වන සතිය තෙක් කාලය යි.

(2) සංසේචනයේ සිට 2 වන මාසය තෙක් කාලය යි.

(3) සංසේචනයේ සිට 4 වන සතිය තෙක් කාලය යි.

(4) සංසේචනයේ සිට 6 වන මාසය තෙක් කාලය යි.

(25) දරු ප්‍රසූතියේ දී සංකූලතා ඇතිවීම කෙරෙහි බලපාන සාධක වනුයේ, ගර්භණී මවගේ,

(1) වැඩි උස හා වැඩි බර ය.

(2) අඩු අස්ථි ඝනත්වය සහ වැඩි උස ය.

(3) අඩු වයස හා අඩු උස ය.

(4) අඩු බර හා වැඩි උස ය.

(26) ස්ත්‍රී හා පුරුෂ ප්‍රජනක හෝර්මෝන ස්‍රාවය උත්තේජනය කරනු ලබන්නේ,

(1) මොළයේ පිටියුටරි ග්‍රන්ථය මගිනි. (2) පැලෝපීය නාලය මගිනි.

(3) තයිරොයිඩ් ග්‍රන්ථිය මගිනි. (4) අග්න්‍යාශය මගිනි.

(27) ගර්භණී මවකගේ යකඩ අවශ්‍යතාවය කෙරෙහි බලපාන හේතුවක් <u>නොවනුයේ</u>,

(1) මවගේ රුධිර පරිමාව වැඩිවීම ය.

(2) මළ දරු උපත් වැළැක්වීම ය.

(3) කලලයේ රුධිර නිෂ්පාදනය ය.

(4) කලලයේ අක්මාවේ යකඩ තැන්පත්වීම ය.

(28) නිර්මාණයකින් ඉටුවිය යුතු කාර්ය නිසි පරිදි ඉටුවන සේ සැකසී තිබීම හඳුන්වන්නේ,

(1) අලංකාරය ලෙස ය. (2) නිර්මාණශීලී බව ලෙස ය.

(3) ක්‍රියානුරූපී බව ලෙස ය. (4) සජීවී බව ලෙස ය.

(29) නිවස තුළ අලංකාරය මෙන් ම සජීවී බවක් ඇති කිරීම සඳහා යොදා ගත හැකි උපාංගයකි,

(1) ලිපි රඳවනය
(2) බිත්ති සැරසිල්ල
(3) කෘත්‍රිම මල් බඳුන
(4) අත් පිස්නා රඳවනය

(30) විසිතුරු මැහුම් නිර්මාණයේ දී ආරක්ෂක පූර්වෝපායයක් ලෙස යොදා ගත යුතු මෙවලමකි,

(1) දිදාලය
(2) දැති රෝදය
(3) දැති කතුර
(4) මිනුම් මාපකය

(31) ගෘහපිළි සහ ඇඳුම්වල අද්දර අලංකාර කර ගැනීම සඳහා භාවිත කරන අක්සැරසිලි ක්‍රම දෙකකි,

(1) පයිපින් කිරීම හා කෝඩ් ඇල්ලීම
(2) රේන්ද ඇල්ලීම හා බඳන යෙදීම
(3) වෙල්කො ටේප් ඇල්ලීම හා රේන්ද ඇල්ලීම
(4) රැළ පටි ඇල්ලීම හා ක්විල්ට් කිරීම

(32) වමේ සිට දකුණට මසන මැහුම් ක්‍රමයකි.

(1) බ්ලැන්කට් මැස්ම
(2) හැට් මැස්ම
(3) වාටි මැස්ම
(4) පිස්මෙන්තු මැස්ම

(33) අර්ධ කෘත්‍රිම කෙඳි කාණ්ඩයට අයත් කෙඳි වර්ග දෙකක් වනුයේ,

(1) විස්කෝස් රෙයෝන් සහ කියුප්‍රා ඇමෝනියම් ය.
(2) පොලිමයිඩ් සහ පොලිඑස්ටර් ය.
(3) ඇක්‍රිලික් සහ පොලිමයිඩ් ය.
(4) පොලිඑස්ටර් සහ විස්කෝස් රෙයෝන් ය.

(34) ළදරු ඇඳුමක දැකිය හැකි විශේෂ ගුණාංගයකි,

(1) මූට්ටු වැඩි වශයෙන් යොදා ගැනීම.
(2) ජල අවශෝෂකතාව අධික වීම.
(3) විවරය පියවීමට බොත්තම් ඇල්ලීම.
(4) මූට්ටු යොදන විට අතිඡාදන මූට්ටුව යොදා ගැනීම.

(35) ඇඳුමක වාටියක් අලංකාරව නිම කිරීමටත්, රෙදිපිළි අලංකාර කිරීමටත් යොදා ගත හැකි මැහුම් ක්‍රමයක් වනුයේ,

(1) දිග කොට මැස්ම ය.
(2) ගැට පිස්මේන්තුව ය.
(3) සැටින් මැස්ම ය.
(4) ප්‍රංශ ගැට මැස්ම ය.

(36) පහත දැක්වෙන්නේ පවුල් ඒකක තුළ දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයකි.

A - පෞද්ගලිකත්වය ආරක්ෂා වීම
B - ත්‍යාගශීලී බව
C - ආරක්ෂිත බව
D - පහසුවෙන් තීරණ ගත හැකිවීම

මේ අතරින් විස්තෘත පවුලට අයත් සුවිශේෂී ලක්ෂණ දැක්වෙනුයේ,

(1) C හා E වලිනි.
(2) A හා D වලිනි.
(3) A හා B වලිනි.
(4) B හා C වලිනි

(37) නිවසක් ගොඩ නැගීම සඳහා භූමියක් තෝරා ගැනීමේ දී පළමුව තීරණය කළ යුත්තේ,

(1) යටිතල පහසුකම් පිළිබඳව ය.

(2) අවට පරිසරය පිළිබඳව ය.

(3) පවුලේ අවශ්‍යතා පිළිබඳව ය.

(4) තමාට වැය කළ හැකි මුදල් ප්‍රමාණය පිළිබඳව ය.

(38) විවිධ කාර්ය සඳහා පුද්ගලයෙකු විසින් යොදා ගනු ලබන කායික හා මානසික ශක්තිය හැඳින්වෙන්නේ,

(1) දනුම ලෙස ය.

(2) කුසලතා ලෙස ය.

(3) ආකල්ප ලෙස ය.

(4) ශ්‍රමය ලෙස ය.

(39) නොමිලේ හෝ ඉතා සුළු මුදලක් වැය කිරීමෙන් ලබාගත හැකි භෞතික සම්පතකි,

(1) ජල පහසුකම්

(2) ප්‍රජා පහසුකම්

(3) විදුලිය පහසුකම්

(4) ඉඩකඩ පහසුකම්

(40) නිවසකට ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය මැනවින් ලබා ගැනීම සඳහා යොදා ගත හැකි අනුයෝගී ක්‍රමයක් <u>නොවන්නේ,</u>

(1) මැද මිදුලක් යෙදීම ය.

(2) වහලේ උස වැඩි කිරීම ය.

(3) දොර ජනේල යෙදීම ය.

(4) වහලයේ හැඩයට සිවිලිම යෙදීම ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

(i) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉඩකඩ හා රාශිකරණයට වැඩි අවධානයක් යොමු කරමින් සැලසුම් කළ නිවසක, නව යුවලක් ඉතා සතුටින් ගෙදර දොර අලංකාරව තබා ගනිමින් ජීවිකාව ගෙන යති. මාස හයක ගැබිණියක් වූ බිරිඳ, ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අතර, ස්වාමිපුරුෂයා ධාන්‍ය හා මාෂ බෝග වර්ග එක්කොට ගත් පිටිමෝලි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය කර, අලෙවි කරනු ලබයි.

(1) මෙම පවුල පසුවන අවධිය නම් කර, කෙටියෙන් හඳුන්වන්න.

(2) රාශිකරණය යන්න හඳුන්වන්න.

(3) නිවස සංවිධානයේ දී එහි අලංකරණය සඳහා භාවිත වන උපාංග මොනවා ද?

(4) ගර්භණී අවධියේ දී බලපෑම් ඇති කළ හැකි අවදානම් සාධක හතරක් ලියන්න.

(5) කෙටියෙන් පැහැදිලි කරන්න.

a. ඩිම්බ අවධිය -

b. භ්‍රෑණ අවධිය -

(6) ගුණාත්මක ලක්ෂණ ආරක්ෂා වන අයුරින් ආහාර පිළියෙළ කිරීමේ දී අනුගමනය කරන ශිල්පීය ක්‍රම හතරක් සඳහන් කරන්න.

(7) දියාරු පිටිමෝලි යන්න හඳුන්වා, එම පිටිමෝලි වර්ගයෙන් සකස් කෙරෙන ආහාර වර්ග දෙකක් ලියන්න.

(8) ධාන්‍ය හා මාෂ බෝගවල ඌන අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ලයක් නම් කරන්න.

(9) ඇඳුම් නිර්මාණ සඳහා යොදා ගත හැකි මූට්ටු වර්ග හතරක් ලියන්න.

(10) මැසීමේ දී තාවකාලික හෙවත් අස්ථිර මැහුම් ක්‍රමයක් වන නූල් ඇදීම සිදුකරන අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2 × 10 = 20)

(02) (1) උපාංග නිර්මාණය කිරීමෙන් ඔබ අත්පත් කරගන්නා ප්‍රයෝජන මොනවා ද? (ලකුණු 02)

(2) ශාකමය හා සත්ත්වමය කෙඳි වර්ගවලට උදාහරණ දෙක බැගින් ලියන්න. (ලකුණු 02)

(3) (a) ළදරු ඇඳුම් සඳහා කපු රෙදි යෝග්‍ය වීමට හේතු දෙකක් දක්වන්න. (ලකුණු 02)

(b) ඇඳුම් නිර්මාණය හා සම්බන්ධ රෙදි පිරියම් කිරීම හා සම්මත මිනුම් ලබා ගැනීම පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(03) (1) කාබෝහයිඩ්‍රේට්වලින් මිනිස් සිරුර තුළ ඉටුවන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) (a) සිරුරේ නිරෝගී පැවැත්ම සඳහා ජලයෙන් ඉටුවන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) ඛනිජ වර්ගීකරණය දක්වන්න. (ලකුණු 02)

(3) (a) අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(b) තීව්‍ර මන්දපෝෂණය යනුවෙන් හැඳින්වෙන්නේ කුමන තත්ත්වයක් ද, යන්න සඳහන් කරන්න. (ලකුණු 02)

(04) (1) ආහාර වේල් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් දක්වන්න. (ලකුණු 03)

(2) ආහාර පිරමීඩයේ අවම වශයෙන් ගතයුතු ආහාර වර්ග, වැඩි වශයෙන් ශරීරයට ලබා ගතහොත් ඇතිවිය හැකි රෝගී තත්ත්ව තුනක් ලියන්න. (ලකුණු 03)

(3) (a) ආහාර නරක්වීම කෙරෙහි බලපාන රසායනික සාධක උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 02)

(b) යොවුන් වියේ දරුවකුට සුදුසු දිවා ආහාර වේලක බොජුන් පතක් ලියන්න. (ලකුණු 02)

(05) (1) පවුලේ සාමාජිකයන් තුළ තිබිය යුතු යහපත් ගති ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

(2) ජීවත් වීම සඳහා නිවස අවට යහපත් පරිසරයක තිබිය යුතු ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) (a) මුදල් වශයෙන් ලැබිය හැකි ආදායම් මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(b) භෞතික සම්පත් සේ සැලකෙන 'ඉඩකඩ' යන්නෙන් අදහස් කෙරෙනුයේ කුමක් ද? (ලකුණු 02)

(06) (1) නව යෞවන අවධියේ මානසික වර්ධනය බාහිරව පෙන්නුම් කරන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(2) සමාජ කේන්ද්‍රීය බව වැඩි දියුණු කර ගැනීමට යෞවනයා දරණ උත්සාහය තුළ ඔහු විසින් අත්පත් කර ගන්නා ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) (a) ගර්භණීභාවයට පත්වීමෙන් පසු ආර්ථවය නැවතීමට හේතුව සඳහන් කරන්න. (ලකුණු 02)

(b) කලල බන්ධය නිර්මාණය වන ආකාරය සඳහන් කරන්න. (ලකුණු 02)

(07) (1) ඉදුණු පලතුරුවල නැවුම් බව, වර්ණය අනුව හඳුනාගන්නා ආකාරය උදාහරණ සහිතව සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ආහාර සකස් කිරීමේ දී, පිළියෙල කිරීම හා පිසීම යන ක්‍රියාවලියට අයත් පියවර දක්වන්න. (ලකුණු 03)

(3) (a) පාන් සෑදීමට යොදා ගන්නා පිටි මෝලිය පිපීම සිදුවන්නේ කෙසේ ද? (ලකුණු 02)

(b) අපරදිග සංස්කෘතියට අනුව එක් පුද්ගලයෙකු සඳහා ආහාර පිළිගන්වන ක්‍රමය රූප සටහනක් ඇසුරින් දක්වන්න. (ලකුණු 03)